# 8 වන வது th

# ජාතික ජම්බෝරිය
# தேசிய ஜம்போரி
# National Jamboree

26th To 31st DECEMBER

TOWARDS 100 YEARS IN SCOUTING
8TH NATIONAL JAMBOREE
Hambantota
Sri Lanka

SCOUTS
Creating a Better World


# 2010

## ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
## இலங்கைச் சாரணர் சங்கம்
## SRI LANKA SCOUT ASSOCIATION

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org




# 8 ජාතික ජම්බෝරිය
# தேசிய ஜம்போரி
# National Jamboree

**2010** දෙසැම්බර් **26 - 31** දක්වා
හම්බන්තොට අඟුණුකුල පැලැස්සේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## අතිගරු ජනාධිපතිතුමාගෙන් බාලදක්ෂ දරු දැරියන් වෙත......

හම්බන්තොට එරම්නියායේ දී පැවැත්වෙන අට වන ජාතික බාලදක්ෂ ජම්බෝරියට සහභාගී වන බාලදක්ෂ දරු දැරියන් වෙත මාගේ සුබ පැතුම් පිරිනමමි. ලෝකයේ බාලදක්ෂ ව්‍යාපාරය ආරම්භ වී සියවසක් ගතව තිබේ. අපේ රටේ ද බාලදක්ෂ ව්‍යාපාරය ආරම්භ වී සියවසකට ආසන්න ය. මෙකී කාලය තුළ ලෝකයට මෙන් ම අපේ රටට ද බාලදක්ෂ ව්‍යාපාරය විසින් ඉටු කර ඇති සමාජ මෙහෙවර අති විශාල ය. මේ රටේ ප්‍රධාන බාලදක්ෂයා ලෙස මා ඒ මෙහෙවර සිහිපත් කරන්නේ මහත් වූ ගෞරවයෙන් යුතුව ය.

සැමට සාධාරණය ඉටු වන්නේ විනය ගරුක සමාජයකින් බව මම දැඩිව විශ්වාස කරමි. මහින්ද චින්තන වැඩපිළිවෙළ රටට ඉදිරිපත් කිරීමේ දී සියල්ලට පෙර මේ පිළිබඳව අවධානය යොමු කළේ එබැවිනි.

රටට ආදරය කරන, නායකත්වය මෙන් ම ප්‍රජාවට ගරු කිරීම, සාමූහික බව, අන්‍යයන් වෙනුවෙන් කැපවීම, ඉදිරිපත් වීමේ පෞරුෂය ආදී ගුණාංග බාලදක්ෂයින් වෙතින් සමාජයට හිමි වෙයි. නිදහස් වූ අප මාතෘ භූමිය නිවුණු සැනසුනු දේශයක් බවට පත්කිරීමට මෙකී ගුණාංග මහත් සේ ඉවහල් වන බව මාගේ විශ්වාසයයි.

බාලදක්ෂ ව්‍යාපාරය අප රට මුහුණ පෑ ව්‍යසනයන්හි දී සිය වගකීම නොපිරිහෙලා රට වෙනුවෙන් ඉටු කර තිබේ. සුනාමි ව්‍යසනය සිදු වූ අවස්ථාවේ දී ඔවුන්ගේ මෙහෙවර කැපී පෙනුනි ගංවතුර, නියඟය වැනි අප රටට බල පෑ ස්වාභාවික විපත් වලදී ද බාලදක්ෂයන් රටේ ජන ජීවිතය සුරක්ෂිත කිරීම කිසි විට පැහැර හැරියේ නැත. ඔවුන් එවැනි අවස්ථාවල ප්‍රදර්ශණය කළ නායකත්වය සමාජයටම ආදර්ශයක් බව මාගේ විශ්වාසයයි.

රටට ආදරය කරන රටේ අභිමානය සුරකින පරපුරක් වෙනුවෙන් තව තවත් කැපවීමට බාලදක්ෂ ව්‍යාපාරයට ශක්තිය ධෛර්යය ලැබේවා! යි මම ප්‍රාර්ථනා කරමි.

මහින්ද රාජපක්ෂ
ප්‍රධාන බාලදක්ෂ,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ශ්‍රී ලංකාවේ ප්‍රධාන බාලදක්ෂයින්

# CHIEF SCOUTS OF SRI LANKA










Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## அதிமேதகு சனாதிபதியிடமிருந்து சாரணர் சிறுவ சிறுமிகளுக்கு.......

ஹம்பன்தொட்ட எரமிணியாயவில் நடைபெறும் எட்டாவது சாரணர் ஜம்போரியில் பங்கேற்கும் சாரணர் சிறுவ சிறுமிகளுக்கு எனது வாழ்த்துக்களை தெரிவித்துக்கொள்கிறேன். உலக சாரணர் இயக்கம் ஆரம்பமாகி நூற்றாண்டு ஒன்று கடந்துள்ளது. நமது நாட்டின் சாரணர் இயக்கமும் நூற்றாண்டை நெருங்கிக்கொண்டிருக்கின்றது. இக் காலப்பகுதியில் சாரணர் இயக்கமானது உலகிற்கு மாத்திரமல்லாது நமது நாட்டிற்கும் புரிந்த சேவை அதிகூடியது. அச் சேவையை இந் நாட்டின் பிரதம சாரணன் என்ற வகையில் மிக கௌரவத்துடன் நினைவுக்கூறுகிறேன்.

ஒழுக்கமுள்ள சமுதாயமொன்றின் மூலமாக அனைவருக்கும் நியாயம் கிடைக்கும் என நான் திடமாக நம்புகிறேன். ஆகையால் மகிந்த சிந்தனை வேலைத்திட்டத்தை நாட்டிற்கு சமர்ப்பிக்கையில் அனைத்திற்கும் முதலாக இதைக்குறித்து கவனம் செலுத்தினேன்.

நாட்டை நேசிக்கும் தலைமைத்துவம், மக்களை கௌரவித்தல், ஒற்றுமை, ஏனையோர்களுக்காக அர்ப்பணித்தல், முன்வருதலின் ஆளுமை போன்ற குணாதிசயங்கள் சாரணர்களிடமிருந்து சமுதாயத்திற்கு கிடைக்கின்றது. சுதந்திரமடைந்த நமது தாய்நாடு அமைதியான நாடாக மாற்றமடைவதற்கு இக் குனாதிசயங்கள் பேருதவியாக இருக்கும் என்பது எனது நம்பிக்கை.

சாரணர் இயக்கம் நமது நாடு முகங்கொடுத்த பேரழிவகளின் பொழுது தமது பொறுப்பை தயங்காது நாட்டிற்கு வழங்கியுள்ளனர். சுனாமி பேரழிவு ஏற்பட்ட பொழுது அவர்களின் மகத்தான சேவை தலைசிறந்தாக அமைந்தது. வெள்ளம், வறட்சி போன்ற இயற்கை அனர்த்தங்கள் நமது நாட்டை பாதித்த பொழுதுகளில் நாட்டு மக்களின் பாதுகாப்பை குறித்த கவனத்தை சாரணர்களினால் ஒரு பொழுதும் கைவிடப்படவில்லை. அவர்கள் அச் சந்தர்ப்பங்களில் வெளிப்படுத்திய தலைமைத்துவம் சமுதாயத்திற்கே சிறந்த எடுத்துக்காட்டாக அமைந்தது என்பது எனது நம்பிக்கை.

நாட்டை நேசிக்கும், நாட்டின் அபிமாணத்தை பாதுகாக்கும் தலைமுறைக்காக மேலும் அர்ப்பணிப்புடன் பணியாற்றுவதற்கு பலமும் தைரியமும் சாரணர் இயக்கத்திற்கு கிடைக்க வேண்டும் என நான் வாழ்த்துகிறேன்.

ஜனாதிபதி
பிரதம சாரணர்
இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அதிமேதகு சனாதிபதி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ගරු අගමැතිතුමාගෙන් බාලදක්ෂ දරු දැරියන් වෙත....



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 8 වන බාලදක්ෂ ජම්බෝරිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ රන්න අඟුණුකොලපැලැස්ස එරමිණියාය හි දී පැවැත්වෙන මෙම අවස්ථාවේ මාගේ සුභපැතුම් එක් කරමි.

බාලදක්ෂ ව්‍යාපාරයට සම්බන්ධ වූ දරුවන් සෑම අංශයකින්ම දක්ෂ විශිෂ්ඨ වූ දරුවන් බව කිව යුතුය.
බාලදක්ෂ ව්‍යාපාරයේදී ඔවුන් ලබාගන්නා දැනුම හා අවබෝධය, නොසැලෙන ඍජු බව, ඔවුන්ගේ පෞද්ගලික ජීවිතය සාර්ථක කරගැනීමට ද ඉවහල් වී ඇති නිසාම බාලදක්ෂ ව්‍යාපාරය ඉතා සාර්ථක ව්‍යාපාරයක් බව කිව යුතුය. බේඩන්පවල් සාමි තුමා විසින් 1907 දී එන්ගලන්තයේ බ්‍රවුන්සි දිවයිනේදී ආරම්භ කරන ලද බාලදක්ෂ ව්‍යාපාරය 1912 දී ශ්‍රී ලංකාවේ ආරම්භ කෙරුණි. ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරය මේ වන විට සිය ශත සංවත්සරය අභිමුවට පැමිණ සිටී. ශත වර්ෂයකට ආසන්න වී ඇති බාලදක්ෂ ව්‍යාපාරය දෑහිතකාමි අභිමානවත් පුරවැසියන් රැසක් බිහිකිරීමට සමත්ව තිබීම සතුටට කරුණකි.

08 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය අතිශයින් සාර්ථක වේවා!

දි. මු. ජයරත්න
අග්‍රාමාත්‍ය
2010 දෙසැම්බර් 10 වන දින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් බාලදක්ෂ දරු දැරියන් වෙත.......



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 8 වන බාලදක්ෂ ජම්බෝරිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ රන්න, ගුණුකොලපැලැස්ස, එරම්ණියාය හි දි පැවැත්වෙන මෙම අවස්ථාවේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් මාගේ උණුසුම් සුභපැතුම් එක්කිරීමට මෙය අවස්ථාව ගතිමි.

බේඩන්පවල් සාමි තුමා විසින් 1907 දී එන්ගලන්තයේ බ්‍රවුන්සි දිවයිනේ දී ආරම්භ කරන ලද බාලදක්ෂ ව්‍යාපාරය1912 දී ශ්‍රී ලංකාවේ ආරම්භ කල අතර මේ වන විට සිය ශත සංවත්සරය අභිමුවට පැමිණා සිටින මෙම අවස්ථාවේ මෙවැනි ජාතික බාලදක්ෂ ජම්බෝරියක් පැවැත්වීම අතිශය වැදගත් කාර්යයක් කොට සලකමි.

ශ්‍රී ලංකාවේ බාලදක්ෂ කටයුතු ආරම්භ කල මුල් අවදියේ පටන් බාලදක්ෂ ව්‍යාපාරය ශක්තිමත්ව පදනම් වූයේ පැවැති පාසැල් පද්ධතිය මත වන අතර ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර මනා අවබෝධයකින් යුක්තව දියුණු හවුල් සහ සම්බන්ධතාවයක් බාලදක්ෂ ව්‍යාපාරයේ දියුණුව සඳහා මෙන්ම පාසැල් දරු දැරියන්ගේ චරිත සහ ආකල්ප වර්ධනය සඳහා ද අතීතයේ පටන් මේ දක්වා ඉතා ශක්තිමත් ලෙස පවතී. එතුලින් ශ්‍රී ලංකාවේ දරු පරපුර වෙත බාලදක්ෂ ව්‍යාපාරයේ යහපත් ආකල්ප මෙන්ම දක්ෂතා ද පරම්පරා ගණනාවක් පුරා දියුණුවෙන් දියුණුවට යමින්, ආකල්ප, චරිත, සංවර්ධනය උදෙසා අතීතයේ මෙන්ම වර්තමානයේ දී ද අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ලබාදීමට හැකිවීම අගය කොට සැලකිය යුතු කාරණායකි.

නව සියවසේ නව අභියෝග ජයගනිමින් ආශ්චර්යයමත් ශ්‍රී ලංකාවක් බිහිවන හෙට දිනයේදී ද ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරය තම මහඟු සේවය ලාංකීක දරු දැරියන් වෙත වඩාත් සම්පව සහ වඩාත් කාර්යක්ෂමව ද ලබාදෙනු ඇතැයි බලාපෙරොත්තු වෙමි.

08 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා!

බන්දුල ගුණවර්ධන

අධ්‍යාපන ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## Message From the Regional Director, World Organization of the Scout Movement, Asia-Pacific Region



On behalf of 25 million Scouts of the Asia-Pacific Region, congratulations for organizing the 8th National Scout Jamboree of Sri Lanka which will be held from 26-31 December 2010 at Hambantota District in Sri Lanka.

With this Jamboree, I am confident that it will be an occasion once again for Scouts from all corners of the country to meet each other and to enjoythe camp life with an unforgettable experience in this beautiful southern city of Sri Lanka.

With this Jamboree, Sri Lanka Scouts Association is also adding another milestone to its fast developing Scouting history leading towards the celebration of the hundred years of Scouting in the country in 2012.

This Jamboree is organized to host 8,000 participants! The largest gathering in Sri Lanka Scouts Association's history with a timely Jamboree
**Theme - Towards the Century.**

I urge all participants to embrace the words of the Jamboree Song into your heart, body and mind, as it calls upon all Scouts and leaders for unity as well as for peace among all of you, irrespective of race or religion. This will truly bring out the message of Scouting.

My heartiest congratulations also to the volunteers as we move to 2011 to celebrate international year of volunteering (IYV+10) and we owe much to those dedicated leaders who have carried the Scouting flame over the past nearly hundred years.

All the best for a successful Jamboree!

**Abdullah Rasheed**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය



හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණුකොළපැලැස්ස එරම්ණියාය හිදී පැවැත්වෙන 8 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියේ සමරු කළාපයට පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මා සතුටට පත් වෙමි. ලෝකයේ බාලදක්ෂ ව්‍යාපාරය ආරම්භ කොට සියවසක කාලයක් අවසන්ව නව සියවසක පියවර තබන මෙම අවස්ථාවේ ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරය ද සිය ශත සංවත්සරය අභිමුවට පැමිණ සිටී.

දැයේ දූ දරුවන් බාලදක්ෂ ව්‍යාපාරය තුල හික්මීමෙන් යුතු විනය ගරුක ධෛර්‍යය සම්පන්න හා දක්ෂ දරු දැරියන් වශයෙන් මෙම නව සියවසේ වඩාත් පුලුල්ව සහ සිත් ඇද ගන්නා අයුරින් ස්වකීය වගකීම් තම රටට හා ජනතාවට ඉටු කිරීමට සූදානම්ව අද දින මෙම ජම්බෝරියේදී කැඳවුරු බදිනු ඇතැයි මම විශ්වාස කරමි.

ලෝකයේ බාලදක්ෂ ව්‍යාපාරය නව සියවසට ඔබින ආකාරයෙන් නව දැනුමෙන් සන්නද්ධව තරුණ ජනයාගේ රුචිකත්වය අනුව ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොරව සිය වැඩසටහන් මෙහෙයවන අතර ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අපි ද  එකී නව ප්‍රවනාතාවයන්ට අනුගතව අපගේ බාලදක්ෂ සේවාවන් ශ්‍රී ලංකාව පුරා විහිද යන ආකාරයෙන් නවීකරණය කොට ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිමු.

මෙහිදී එම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමා,ගරු අධ්‍යාපන ඇමතිතුමා ඇතුලු රජයේ සියලු නිලධාරීන්ගෙන් ඔවුන්ගේ උපරිම සහය ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින අතර එම සහය නොඅඩුව ලැබේ යයි අපේක්ෂා කර ද සිටිමු. එහිලා ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය භට ව්‍යාපාරයට රජයෙන් ලැබෙන අනුග්‍රහයට නොදෙවෙනි අනුග්‍රාහයක් අපිද බලාපොරොත්තු වන බව මෙහිලා සඳහන් කරමි.

ලෙස්ලි රූපසිංහ
ගරු සභාපති
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# CHIEF COMMISSIONERS
# OF
# SRI LANKA SCOUT ASSOCIATOON


Mr.F.G. Stevens
(1912-20)


Mr C. Brooke-Elliott
(1920-1925)


Mr. Vernon Grenier
(1925-30)


Mr J.H De Saram
(1930-42)


Mr K. Somasuntharam
(1942-48)


Brigadier, C.P Jayawardhane
(1948-1954)


Mr E.W. Kannangara
(1954-67)


Mr F.H. Gunasekera
(1967-72)


Mr C. M. P. Wanigatunga
(1972-77)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රධාන කොමසාරිස්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 8 වන බාලදක්ෂ ජම්බෝරිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ රන්න, අඟුණුකොලපැලැස්ස, එරමිණියාය හි දී පැවැත්වෙන මෙම අවස්ථාවේ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රධාන කොමසාරිස්වරයා වශයෙන් මෙම පණිවිඩය නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

බේඩන්පවල් සාමි තුමා විසින් 1907 දී එන්ගලන්තයේ බ්‍රවුන්සි දිවයිනේ දී ආරම්භ කරන ලද බාලදක්ෂ ව්‍යාපාරය සිය දෙවන ශතකය තුලත් සාර්ථක ඉදිරි ගමනක නියැලෙන අතර ශ්‍රී ලංකාවේ බාලදක්ෂ ව්‍යාපාරය 1912 ආරම්භ කොට මේ වන විට සිය ශත සංවත්සරය අභිමුවට පැමිණ සිටි. ශත වර්ෂයකට ආසන්න මෙම අනගිභවනීය කාල සිමාවේදී බාලදක්ෂ ව්‍යාපාරය රටට හිතැති දැහිතකාමී අභිමානවත් පුරවැසියන් බිහිකිරීමට මෙන්ම රටේ සංවර්ධනය සඳහා ද අති මහත් සේවයක් සිදුකොට ඇත.

එමෙන්ම ශ්‍රී ලංකාවේ බාලදක්ෂ ව්‍යාපාරය තුල 21 වන සියවසේ අවශ්‍යතාවයන් මැනවින් ඉටු කරමින් අද අපි සාමාන්‍ය බාලදක්ෂ කටයුතු මෙන්ම ගුවන් හා නාවික බාලදක්ෂ කටයුතු වඩාත් ව්‍යාප්තව සිදු කිරීමට ද අශ්වාරෝහක බාලදක්ෂ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ද නිදසුන් ලෙස දැක්විය හැක.

2010 වර්ෂයේ 08 වන ජාතික ජම්බෝරිය පැවැත්වීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොලපැලැස්ස එරමිණියාය තෝරා ගනු ලැබුයේ සීඝ්‍ර සංවර්ධනයකට ලක් වන සහ අනාගත අභියෝග භාර ගැනීමේදී මනා නිපුනත්වයක් දක්වන දේශපාලන නායකත්වයකින් යුක්තවීමත්, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මෙවැනි බාලදක්ෂ ජම්බෝරියක් ප්‍රථම වතාවට පැවැත්වීමත් කරන කොටගෙනය.

මෙහි ලා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රධාන අනුශාසක හා ප්‍රධාන බාලදක්ෂයා වන අතිගරු ජනාධිපතිතුමාගේ කැපවීම සහ මග පෙන්වීමත් සංවිධානය සඳහා ලබා දුන් සහයත් ඉමහත් සේ අගය කොට සලකන අතර හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීන්වරුන් වන ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාගේ ද ආපදා කළමණාකරන අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ද සහය අප වෙත නොලැබුනේ නම් මෙම කාර්යය සාර්ථක නොවනු ඇති බව මා විශ්වාස කරමි.

මෙම ජම්බෝරිය සාර්ථක කර ගැනීමෙහි ලා සහය ලබා දුන් සියලුම රජයේ නිලධාරීන්, පෞද්ගලික ව්‍යාපාරික මහතුන්, අපගේ සියලුම බාලදක්ෂ නිලධාරීන් ඇතුලු සියලු දෙනා වෙත ද ජම්බෝරියට සහභාගීවන බාලදක්ෂ දු දරුවන් වෙත ද ඔවුන්ගේ දෙමව්පියන් වෙත ද ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රනාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

08 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියට උණුසුම් සුභපැතුම් !

සී බටුවන්ගල
ප්‍රධාන කොමසාරිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



Mr H. Ratnasuriya
(1977-82)



Mr T. Seneviratne
(1982-1987)



Mr Rex Jayasinhe
(1988-1990)



Mr J. Lionel Silva
1990-1994



Mr M.M. Mohideen
(1994-1997)



Mr K.H. Camillus Fernando
**(1997-2002)**



**Mr. H.S Weerakoon**
**(2002-2007)**



**Mr. C. Batuwangala**
**From 2007**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# Message From the Organizing Commissioner



I am honored and privileged to give this message to the souvenir of the 8th National Scout Jamboree, with the theme 'TOWARDS 100 YEARS OF SCOUTING'

Jamborees are much looked forward to, by Scouts, Leaders ,Commissioners and Supporters of Scouting who like harmonious living with nature, interaction with brother scouts and host of other memorable activities all day long throughout the Jamboree. A Jamboree is unique, setting it apart from other youth events and gatherings, is solely attributed towards its VOLUNTARY SERVICE. Without a loyal and a dependable crew of volunteers of Adults in Scouting and Supporters of Scouting who generously contribute their expertise and resources, this Jamboree would not have been a reality. Their services as committed volunteers are PRICELESS. The organizing committee which is composed of these volunteers is the 'BACK BONE' of this Jamboree.

The participating Scouts and Leaders carry on from the lessons learnt from previous Jamborees, grappling with the challenges to move into the campsite, participate in the Jamboree programme and finally prepare to return back home at its conclusion with fond memories of outdoor living in harmony.

I wish to convey my **warm greetings and best wishes** to all participants and colleagues and sincerely hope that their stay in camp was pleasant and will cherish the fellowship and experience in a spirit of camaraderie and good fun.

***I conclude with some quotes from BP's last message……***

***'BE CONTENDED WITH WHAT YOU HAVE GOT AND MAKE THE BEST OF IT'***
***'THE REAL WAY TO GET HAPPINESS IS BY GIVING OUT HAPPINESS TO OTHER PEOPLE'***
***'TRY AND LEAVE THIS WORLD A LITTLE BETTER THAN YOU FOUND IT'***

**SHIRAZ SALIH**
**Assistant Chief Commissioner- International**
**Organizing Commissioner- 8th NSJ**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

With Best Compliments from

ARUNASIRI CAFÉ, STORES AND HARDWARE

Eraminiyaya Junction,

Angunukolapalessa.

T.P. - 047-2228256

With Best Compliments from

MALINDHU SUPER

No. 18,

Ranna Road,

Angunukolapalessa.

T.P. - 047-2229215

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් තුමාගෙන්......



# සුභපැතුම්

2010 දෙසැම්බර් මස 26 වන දින සිට 31 වන දින දක්වා හම්බන්තොට අඟුණුකොල පැලැස්සේ දී පැවැත්වෙන 8වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය සඳහා සුභපැතුම් එක්කරන්නේ හද පිරි සතුටිනි.

සිව් වසරකට වරක් පවත්වන බාලදක්ෂ ජම්බෝරියක් යනු බාලදක්ෂ ගති සිරිත් හුරු පුරුදු වන දරුවන්ට උදාවන අනගි අවස්ථාවකි විශාල පිරිසක් සමග එක්ව කටයුතු කිරීමටත් එකිනෙකා අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමටත් දිවයිනේ සිව් දෙසින් පැමිණෙන පිරිස් සමග නව මිත්‍රත්ව ගොඩනගා ගැනීමටත් විවිධ ක්‍රියාකාරකම්හි යෙදීමටත් දකුණු ලක සමුද්‍රාසන්න ප්‍රදේශයක ගහ කොළ සතා සිව්පාවා පමණක් නොව මුළු භෞතික පරිසරය පිලිබඳව ම සජීව අත්දැනීම් ලබා ගැනීමටත් ජම්බෝරි කාලය තුලදී ඉඩ ප්‍රස්ථා සැලසේ.

2012 දී ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයට වසර සීයයක් සම්පූර්ණ වේ ඒ සඳහා පැවැත්වෙන ජාත්‍යන්තර මට්ටමේ ජම්බෝරියට පෙර හුරුවක් වැනි මෙම ජාතික ජම්බෝරියට සහභාගීවන සැමට ප්‍රීති ප්‍රමෝදයෙන් සපිරුණු රසවත් අත්දැකීමක් වනු නොඅනුමානය.

මෙම මහඟු අවස්ථාව වර්ණවත් කිරීමට සහාය වූ සැමටත් සහභාගිවන සියළුම පෝතක බාලදක්ෂ බාලදක්ෂ මානවක බාලදක්ෂ දූ පුතුන්ටත් ඒ සඳහා මොවුන් දිරිමත් කළ සිටළු නායක මහත්මා මහත්මීන්ටත් ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් ලෙස මගේ උනුසුම් සුභපැතුම් පිරිනමමි.

එම්.ඊ.එස්. ජයසිංහ
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# සොබා දහම් මාතාවට ගීතයක් (උධෘත)

සුක්වාමීස් වරුන්ගේ සහ වොෂින්ටන් හි පියුජට් සවුන්ඩ් නම් ස්ථානය අවට විසූ අනිකුත් ඉන්දියානු ගෝත්‍රිකයන් ගේ නායකයා වූ සැයැට්ල් කළ කථාව, මේ දක්වා පරිසරය පිළිබඳව කරන ලද ඉතාම අලංකාර වූත් ගැඹුරුවූත් ප්‍රකාශය ලෙස සැලකේ. අක්කර මිලියන දෙකක භූමි ප්‍රදේශයක් ඩොලර් 150,000 කට විකිණීම සඳහා ඉන්දියානුවන් කැමති කරවා ගැනීමේ යෝජිත ගිවිසුමට පිළිතුරු වශයෙන් කථාවක් පැවැත්වූ නායකයා ගේ නමින් පසුව සියැට්ල් නගරය නම් කරන ලදී.

නායක සියැට්ල්ගේ කථාව

පොළවේ උණුසුම හෝ අහස හෝ ඔබ විකුණන්නේ හෝ මිළට ගන්නේ කෙසේ ද? එය අපට අමුතු දෙයකි.

වාතයේ සහ බුබුළු නගින ජලයේ නැවුම් බව අට අයත් නොවේ නම්, ඒවා ඔබ මිළ දී ගන්නේ කෙසේ ද? භූමියේ සෑම කොටසක් ම මගේ ජනතාවට පූජනීය වස්තුවකි. දිලිසෙන සෑම පයින් කටුවක් ම, සෑම වාලුකා වෙරළ තීරුවක් ම, කෘමීන් ගේ සිහින් නාදයක් ම මගේ ජනතාවට පූජනීය මතක සටහනක් හා අත්දැකීමකි. රුක් දිගේ ගලා බසින යුෂ සමග ගමන් කරන්නේ රතු ඉන්දියානු මිනිසාගේ මතක සටහන් ය. මිය ගිය සුද්දා තරු සමග ගමන් කරන විට ඔහුට සිය නිජ බිම අමතකයි. අපගේ මළගිය ඇත්තන්ට කිසි විටෙක මේ ලස්සන මහ පොළාව අමතක නොවේ. ඊට හේතුව එය රතු මිනිසාගේ මාතාව වීමයි. අප පොළවේ කොටසකි. පොළව අපගේ කොටසකි. සුවඳ මල් අපගේ සොහොයුරියෝ යි. මුවන්, අසුන් සහ විශාල රාජාලි අපගේ සොහායුරෝ යි. කඳු ශිඛර, තණ බිම් වල සාරය, අශ්ව ශරීරයේ උණුසුම, සහ මිනිස් සිරුරේ උණුසුම තවතව මේ සියල්ලම එක පවුලකට අයත් ය.

වොෂින්ටනයේ ශ්‍රේෂ්ඨ නායකයා අප නිජ බිම මිලට ගැනීමේ පණිවුඩය සමග අපෙන් ඉල්ලන්නේ ඉතා විශාල දෙයකි. ශ්‍රේෂ්ඨ නායකයා පණිවුඩය එවන විට අපට සැපෙන් ජීවත් වීම සඳහා ස්ථානයක් වෙන් කරනු ඇත. ඔහු අපගේ පියා වේ. අපි ඔහුගේ දරුවෝ වෙමු.

එබැවින් අපගේ නිජ බිම මිලට ගැනීමේ යෝජනාව ගැන සළකා බලන්නෙමු. එහෙත් එය පහසු කාර්යයක් නොවනු ඇත. ගංගා ඇලදොල ආදිය දිගේ දිදුලමින් ගලා බසින දිය දහර නිකම් ජලය නොවේ.අප මුතුන්මිත්තන්ගේ රුධිරයයි. ඔබ අප නිජ බිම මිලදී ගන්නෙහි නම් එහි පූජනීයත්වය මතක තබා ගන්න. එම පූජණීයත්වය ගැන ඔබගේ දරුවන් ද දැනුවත් කරන්න. විල් තුල ඇති පැහැදිලි දියෙහි පෙනෙන අවතාර බඳු සෙවනැලි මගින් කියැවෙන්නේ මගේ ජනතාවගේ ජීවිතවල මතක සටහන් ය. ජලයේ මුමුනන හඬ මගේ පියාගේත් පියාගේ කටහඬයි.

ගංගාවෝ අප සොහොයුරෝ වෙති. ඒවා අපගේ පිපාසය සන්සිඳුවයි. ගංගා දිගේ යාත්‍රාකරන ඔරු අප දරුවන්ට අහර සපයයි. අප නිජ බිම විකුණන්නේ නම්, ඔබ සිහි තබා ගත යුතු දෙයක් ඇත. ගංගාවන් අපගේ මෙන් ම ඔබගේත් සොයුරන් බව ඒ කරුණයි. ඒ බව දරුවන්ට උගන්වන්න. එබැවින් ඔබ සිය සොහායුරන්ට දක්වන දයාව ගංගාවලටත් දැක්විය යුතු යි.

අප සිරිත් විරිත් සුද්දන්ට නොතේරෙන බව අපි දනිමු. භූමියේ සෑම කොටසක් ම ඔහුට එක සමානයි. ඊට හේතුව එහු අමුත්තකු වීමයි. රෑ කාලයේ දී පැමිණෙන ඔහු තමාට අවශ්‍ය සෑම දෙයක් ම පොළොවෙන් ලබා ගනී. පොලොව ඔහුට සොයුරෙක් නොවේ. සතුරෙකි. එය අත්පත් කර ගත් පසු ඔහු පිටවී යයි. සිය පියාගේ සොහොන් බිම ද ඔහු අත් හැර යයි. ඒ ගැන ඔහු නොතකයි. ඔහු සිය දරුවන්ගෙන් ද මහ පොළව උදුරා ගනී. එය ඔහුට කම් නැත. සිය පියාගේ සොහොන් බිම මෙන් ම සිය දරුවන් ගේ උපන් අයිතිය ද ඔහුට මතක නැත. සිය මාතාව වන මහ පොළවත්, සිය සොහොයුරා වන අහස ගැනත් ඔහු සලකන්නනේ, තමා මිළ දී ගත්, කොල්ලකා ගත් සහ බැටළුවන් හෝ බැබලෙන පබලු මෙන් විකුණන ලද භාණ්ඩයක් ලෙසයි. ඔහුගේ කුසගින්න, මහ පොළව ගිල දමා කාන්තාරයක් බිහි කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපගේ ගති පැවතුම් ඔබගේ ගති පැවතුම්වලට වඩා වෙනස් දැයි මම නොදනිමි. ඔබග් නගරවල දර්ශනය පවා රතු මිනිසාගේ ඇසට කටුවකි. සුද්දන් ගේ නගර වල නිහඬ තැනක් නොමැත. වසන්ත සෘතුවේ දී තුරු ලතාවන්ගේ පත්‍ර දිගහැරෙන හඬ ඇසෙන තැනක් නොමැත. කෘමින්ගේ පියාපත් වල සරසර නාදය නො ඇසේ. ඝටඝට ශබ්දය කණට හිරිහැරයකි. රාත්‍රී කාලයේ තනිවූ සතකුගේ දුක්මුසු හඬ හෝ පොකුණ අවට ගෙම්බන්ගේ හඬ නොඇසේ. මිනිස් ජීවිතයේ හරය කුමක් ද? මම රතු මිනිසෙක් මි. එය මට නො තේරේ. ජලාශයක් හරහා වේගයෙන් සුළං හමන ශබ්දය සහ මද්දහනේ වැසි දියෙන් පිවිතුරු වූ සුළඟ හෝ පයින් ගස්වල සුවඳ මුදු වූ සුළඟ ආඝ්‍රාණය කිරීමට ඉන්ද්‍රියානුවෝ ප්‍රිය කරති.

රතු මිනිසාට වාතය ඉතා අගනා දෙයකි. ආශ්වාස කිරීම සැමට පොදු දෙයක් වීම ඊට හේතුවයි. තිරිසන් සතුන්, ගස් වැල්, මිනිසා ආදී සෑම වස්තුවකට එය පොදු දෙයකි. තමා ආශ්වාස කරන වාතය ගැන සුදු මිනිසාට හැඟීමක් ඇති බව නොපෙනේ. දින ගණනක් මරණාසන්නව සිටින මිනිසකුට සැර දුගඳ නො දැනේ. එහෙත් අප නිජ බිම ඔබ විකුණන්නේ නම්, එහි වාතය අපට අගනා බව සිහි තබා ගන්න. දිවි පවත්වා ගැනීමට ආධාර වන වාතය ඒ සියල්ලේ ම ජීවයේ කොටස්කරුවෙකි.

අප මුතුන් මිත්තන් ගේ ප්‍රථම ආශ්වාසය ලබා දුන් සුළඟ ඔවුන්ගේ අවසන් සුසුම ද පිළිගනී. අප නිජ බිම ඔබට විකුණන්නේ නම්. සුදු මිනිසාට පවා එහි පැමිණ, තණබිම්වල මල් සුවඳ මුසුවූ මද සුළඟේ ආශ්වාදය, විඳ ගත හැකි ශුද්ධ භූමියක් ලෙස එම පෙදෙස වෙන් කොට තැබිය යුතු ය.

අප නිජ බිම ඔබ මිලට ගැනීමට කැමති යයි සිතමු. ඊට අප එකඟ වුව හොත් ඊට මම එක් කොන්දේසියක් පනවමි. එම භූමියේ වසන තිරිසන් සතුනට සිය සොයුරන් මෙන් සුදු මිනිසා සැලකිය යුතුයි.

මම වනචාරී මිනිසකු බැවින් වෙනත් කිසිවක් මට නොතේරේ. ගමන් කරන දුම්රියක මැදිරියක් තුළින් සුද්දන්ගේ වෙඩිපහරින් දිවි පිදූ මී ගවයන් දහස් ගණනක් ප්‍රෙයරි තණබිම් වල කුණු වෙමින් සිටිනු මා දැක තිබේ. අපගේ දිවි රැක ගැනීමට අත දෙන මී ගවයාට වඩා දුම් දමන යකඩ අශ්වයා වැදගත් වන්නේ කෙසේ දැයි වනචාරියකු වන මට නොවැටහේ.

සතුන්ගෙන් වෙන් වූ මිනිසා කවරෙක් ද? සෑම සතකුම විනාශ වූ පසු, ජීවයෙන් තොර දැඩි හුදකලාබවක් දැනී මිනිසා මිය යාවි. සතුනට යමක් සිදුවේද එය ම මිනිසාට ද සිදු වේ. සෑම දෙයක් ම එකිනෙක හා බැඳී ඇත.

ඔබ දෙපා වලට පෑගෙන භූමියෙහි ඇත්තේ අප මුතුන්මිත්තන්ගේ අළු බව ඔබගේ දරුවනට කියා දෙන්න. අප මුතුන්මිත්තන්ගේ ජීවිතවලින් මහ පොළොව සරු සාරවී ඇති බව ඔවුන්ට කියා දුනහොත්, ඔවුන් පොළවට ගරු බුහුමන් දක්වනු ඇත. මහපොළව අපගේ මාතාව බව අප දරුවන්ට උගන්වා ඇති බව ඔබගේ දරුවන්ට කියා දෙන්න. මහ පොළවට සිදුවන සෑම දෙයක් ම, එම පොළවේ පුතුන්ටත් සිදුවේ. මහ පොළවට මිනිසුන් කෙළ ගසන විට එය ඔවුන් කරන්නේ තමා වෙත මයි.

මේ කරුණ අප දනිමු. මහ පොළව මිනිසා සතු නොවේ. මිනිසා අයත් වන්නේ මහ පොළවට යි. මේ බව අපි දනිමු. රුධිරය මගින් පවුලක් එකට එකතුවන්නාක් මෙන් සෑම දෙයක් ම එකිනෙකට බැඳී ඇත.

තමා අදහන දෙවියන් වහන්සේ මිතුරකු මෙන් ඇවිදිමින්, කථා කරමින් සිටින සුදු ජාතිකයාට පවා මෙම පොදු ඉරණමෙන් නිදහස් විය නොහැක. අපට සොයුරන් සේ සිටීමට ඉඩ තිබේ. මේ කරුණ අපට යම් කිසි දිනක දැක ගන්නට හැකි වේවි. සුද්දන් යම් කිසි දිනක සොයා ගැනීමට ඉඩ ඇති දෙයක් අප දනිමු. ඒ ඔවුන්ගේත් අපගේත් දෙවියන් වහන්සේ එකම තැනැත්තා බවයි.

අපගේ නිජ බිම ඔබ අයත් කර ගැනීමට කැමැත්තක් දක්වන අයුරින් ම දෙවියන් වහන්සේ ද ඔබ සතු යයි සිතනු ඇත. එය එසේ නොවේ. දෙවියන් වහන්සේ මිනිසාගේ දෙවියන් වහන්සේයි. උන් වහන්සේ ගේ දයාව සුදු මිනිසාට මෙන්ම රතු මිනිසාටත් එක සේ සමාන ය. දෙවියන්ට පොළාව වටිනා වස්තුවකි. පොළවට හානි කිරීම එහි මැවුම්කරුට අවමන් කිරීමකි. සුද්දන්ගේ අවසානය ඇතැම් විට අනිකුත් ගෝත්‍රවලට වඩා ඉක්මනින් සිදුවීමට ඉඩ තිබේ. ඔබ සිය යහන අපවිත්‍ර කළොත් කවදා හෝ රාත්‍රියේ දී එම අපද්‍රව්‍ය ඔබගේ විනාශය ලඟා කරයි.

මෙම භූමියට ඔබ ලබා දුන් දෙවියන් වහන්සේ ගේ ශක්තිය සහ මෙම භූමියේ සහ රතු මිනිසුන්ගේ ආධිපත්‍යය ඔබට හිමි වීමට තුඩු දුන් විශේෂ කාරණය නිසා ඔබගේ විනාශය ඔබට දීප්තිමත් ව බැබලීමට ද හේතු වේ.

ඉරණම අපට විශ්මයජනක දෙයකි. මී ගවයින් මරා දමන්නේත්, කුලු අශ්වයින් හීලෑ කරන්නේත්, මිනිස් සුවඳින් බරවූ වනයේ රහස් ස්ථාන, කථා කරන කම්බි නිසා මැකී ගිය මුහුකුරා ගිය කඳු හෙල්වල දර්ශනය අපට නොවැටහීම ඊට හේතුවයි.

නායක සියැටිල්

## ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ
## නව ප්‍රවනතාවයන් තුලින්
## දැරියන්ටද බාලදක්ෂ කටයුතු

### මිශ්‍ර නායකත්වය සහ බාලදක්ෂ ව්‍යාපාරය තුළ මිශ්‍ර අධ්‍යාපනය

යටත් පිරිසෙයින් බාලදක්ෂ ව්‍යාපාරය ආරම්භ වූයේ පිරිමි ළමුන් සඳහා බව පැහැදිලි ය. කාන්තා බාලදක්ෂයින් වීමට බාලිකාවන්ට අවශ්‍ය වූ විට එම මූලධර්ම මත ගොඩ නැගුණු වෙනත් සංවිධානයකට (බාලදක්ෂිකා ව්‍යාපාරය) ඔවුන් යොමුකරන ලදී. ඒ අවධියේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ මිශ්‍ර අධ්‍යාපනය නො තිබුණ බව සත්‍යයකි. කල් යත් ම සමාජ සංස්කෘතික ක්‍රමය නිසා ඊට අවසර ලැබිණ. බාලදක්ෂ සමාගම් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම සමන්විත මිශ්‍ර සංවිධාන බවට පත් විය. මිශ්‍ර අධ්‍යාපනය බිහි විය. වත්මන්හි වොසම් (WOSM) සංවිධානයේ සාමාජික සංගම් වැඩි ගණනක් මෙම ගණයට වැටේ.

සෑම කෙනෙකුගේ ම පෞද්ගලික වෙනස්කම් ගැන සැලකිල්ල යොමු කරමින්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම එක සමානව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දියත් කළ ප්‍රවේශයක් (Approach) ලෙස බාලදක්ෂ ව්‍යාපාරය තුළ මිශ්‍ර අධ්‍යාපනය හැඳින්විය හැක.

කාලය සමග වොසම් (WOSM) සංවිධානයේ මෙහෙවර ද පරිනාමයට පත්ව ඇත. 1966 වසර තෙක් බාලදක්ෂ ව්‍යාපාරය පිරිමි ළමුන් සඳහා ම පමණක් වෙන් වූ ව්‍යාපාරයක් විය. ඇතැම් බාලදක්ෂ සංගම් මුහුණ දුන් සමාජයීය වෙනස්කම් සහ ජාතික අධ්‍යාපනයේ පීඩනය (Pressure) හේතුවෙන්, පිරිමි ළමුන් පමණක් නොව "යොවුන් ජනතාව" ම ප්‍රවර්ධනය කිරීම ඇතුළත් කරමින් අරමුණු පුළුල් කරන ලදී. 1973 වසරේ දී ලෝක බාලදක්ෂ සම්මේලනය (30 වසරකට පෙර) මගින් වොසම් (WOSM) ව්‍යවස්ථාව වෙනස් කරමින් පිරිමි ළමුන් වෙනුවට "යොවුන් ජනතාව" (Young People) යනුවෙන් යොදන ලදී. එහෙත් ගැහැණු ළමුන් බඳවා ගැනීම සඳහා විශේෂ පෙළඹවීමක් හෝ එම කරුණ දිරිගැන්වීමට හේතු කාරක සාදක හෝ ජනිත නොවිය. කාන්තා සාමාජිකත්වය සෙමින් ස්වාභාවිකව වර්ධනය විය. 1991 වසරේ දී කරන ලද සමීක්ෂණය අනුව, එක වයස් කාණ්ඩයකදී පමණක් හෝ සියළුම වයස් කාණ්ඩ වලදී මිශ්‍ර සාමාජිකත්වය විකල්පයක් බවට ලක් කළ බාලදක්ෂ සංගම් පොදු දෙයක් බවට පත් විය. නවතම සංගණනය (1998) අනුව බාලිකාවන් සහ යොවුන් කාන්තාවන් 1,040,000 ක් බාලදක්ෂ ව්‍යාපාරයේ නියැලී සිටින බව හෙලි වේ. එහෙත් 2003 වසරේ දී සංඛ්‍යාව තවත් වැඩි වන්නට ඉඩ තිබේ

1998 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද ගෝලීය සාමාජිකත්වය පිළිබඳ සංඛ්‍යා අනුව ලෝක බාලදක්ෂ සංවිධානයේ (WOSM) කාන්තා සාමාජිකත්වය (බාලිකා හා කාන්තා) වැග්ස් (WAGGGS) සංවිධානයේ පූර්ණ සාමාජිකත්වයෙන් 19% කි.

| | වැග්ස් | වොසම් |
|---|---|---|
| බාලිකාවන් හා යොවුන් කාන්තාවන් | 7,087,486 | 1,040,000 |
| පිරිමි ළමුන් හා තරුණයින් | 11, 468 | 23,963,180 |
| වැඩිහිටි (ස්ත්‍රී , පුරුෂ) | 1,274,331 | 2,791, 425 |
| "මුළු ගණන නවතම එකතුව, ශ්‍රේණි ගත නොකළ | 158,719 | — |
| | 8,532,005 | 27,794,605 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැග්ස් සංවිධානයට අයත් නායකයින් (පුරුෂ) සංඛ්‍යාව වාර්තා කර නැතත්, එය අල්ප ය. (WOSM) වොසම් සංවිධානයේ ලොව පුරා සිටින නායිකාවන් (කාන්තා) ගණන 588,767 කි. එය වැග්ස් සංවිධානයට අයත් නායිකාවන්ගෙන් අඩක් පමණ වේ. (මූලාශ්‍රය –The facts finding study (WOSM/WAGGGS) made by Mr. John Beresford).

බාලදක්ෂ ව්‍යාපාරය තුළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සියළුම තනතුරු සඳහා සමාන අයිතියක්. වොසම් (WOSM) සහ ජාතික නිලධාරී මණ්ඩලය තුල තිබේ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සාමාජිකත්වය පිළිබඳ අනුපාතය සමතුලිත නොවූවත්, ඇතැම් රටවල් වල ප්‍රධාන කොමසාරිස්ධුරය ඇතුළු සෑම අංශයකම තනතුරු කාන්තාවෝ හොබවති.

ඉහත දැක්වෙන කරුණු හා සංඛ්‍යා අනුව, බාලදක්ෂ ව්‍යාපාරය පිරිමි ළමුන් සඳහා පමණක් සීමා වූ සංවිධානයක් නොවන බව නිසැක ය. වොසම් සංවිධානය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම යොවුන් ජනතාවට විවෘත බව න්‍යායකට (Theory) හෝ කඩදාසියට පමණක් සීමා වූ සංකල්පයක් නොවේ.

වොසම් සංවිධානයේ නවතම ප්‍රතිපත්තිය කාන්තා සාමාජිකත්වයේ ක්‍රියාකාරීත්වය දිරිගැන්වීම යි.

මේ කරුණ සනාථ කිරීමට අවශ්‍ය සාධක Policy on girls and Boys, Women and men within the Scout Movement' the World Scout Conference resolutions, the Strategy for Scouting, සහ (WOSM) සංවිධානයේ සියළුම කටයුතු සඳහා මිශ්‍ර අධ්‍යාපනය අන්තර්ග්‍රහණය, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම බාලදක්ෂ ව්‍යාපාරයේ සෑම පැතිකඩක් තුළම සමාන අවධාරණය යනාදියෙන් දැක්වේ (Policy on girls and Boys, women and Men within the Scout Movement.)

බාලක බාලිකාවන් සහ ස්ත්‍රී පුරුෂයින් සඳහා බාලදක්ෂ ව්‍යාපාරයේ ප්‍රතිපත්ති

වොසම් (WOSM) සංවිධානයේ බාලිකා සාමාජිකත්වය ක්‍රම ක්‍රමයෙන් සහ ස්වාභාවික අන්දමින් වර්ධනය වූයේ, දිරිගැන්වීමකින් හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍ර වලට සමාන විශේෂිත ප්‍රතිපත්තිවලින් තොරවයි. බොහෝ සංගම් වල බාලදක්ෂ කටයුතු ප්‍රවර්ධනය වූයේ පුරුෂ සංවිධානයකිනි. බාලිකාවන් හා කාන්තාවන්ගේ සාමාජිකත්වය දිගු කාලයක් පුරා පැවතුනත්, ඔවුන් ගේ අවශ්‍යතා, වැඩ සටහන්, නායකත්වය සඳහා අවස්ථා සහ බාලිකාවන්ට හා කාන්තාවන්ට සම්පූර්ණ වශයෙන් සහභාගි විය හැකි ව්‍යූහයක් පිළිබඳව ප්‍රමාණවත් සැලකිල්ලක් යොමු වී නොතිබිණි. බාලදක්ෂ ව්‍යාපාරය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම විවෘත වීමෙන් පමණක් එය සතු අධ්‍යාපනික යෝජනා මගින් ඉබේ ම එම දෙපාර්ශවයේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ලීමට සමත් බව අදහස් නොවේ.එසේ ම මෙම ව්‍යාපාරයට සම්බන්ධ තරුණයින්ට හෝ වැඩිහිටියන්ට හෝ, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම සැදුම් ලත් පරිසරයක, සමාන අවස්ථා භුකිත් විඳින කොටස් කරුවන් ලෙස ඉබේ ම හා ක්ෂණිකව එකට කටයුතු කිරීමේ හැකියාවක් ද අදහස් නො කෙරේ.

1999 වසරේ ඩර්බන් නුවර පැවැත්වූ 35 වන ලෝක බාලදක්ෂ සම්මේලනයේ දී, බාලක බාලිකාවන් හා ස්ත්‍රී පුරුෂයින් බාලදක්ෂ ව්‍යාපාරයේ සෑම අංශයකට ම සහභාගි කරවා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් ගැන තීරණය විය. ඒ අනුව සාමාජිකත්වය, යොවුන් වැඩ සටහන්, බාලදක්ෂ ව්‍යාපාරයේ වැඩිහිටියන් සහ කලමනාකාරීත්වය මෙන්ම, බාලදක්ෂ ව්‍යාපාරයේ ලෝක හා ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධතා ගැන ද තීරණය වී ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රතිපත්තිය පිළිබඳව උපුටාගත් කොටසක් පහත දැක්වේ. සිය මෙහෙවර පිළිබඳ රාමුව තුළ සහ සාමාජිකත්වය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව ජාතික සංගම් සතු ස්වාධීපත්‍යය ගැන අභිතකර හැඟිමකින් තොරව බාලදක්ෂ ව්‍යාපාරය එහි කැපකරය ප්‍රකාශයට පත් කරයි.

- එහි අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලිමට, යොවුන් ජනතාව, ස්ත්‍රී පුරුෂයින්ට සමාන පුද්ගලයින් ලෙස සැබවින් ම , සෑම පුද්ගලයකුගේ ම අවශ්‍යතා හා සිතුම් පැතුම් පදනම් කොට අධ්‍යාපනයට දායක වීමට
- බාලදක්ෂ කටයුතු වලදීත්, සමස්තයක් වශයෙන් සමාජය තුළදීත්, ස්ත්‍රී පුරුෂයින් අතර සමාන අවස්ථා සහ කොටස් කරුවන් වීමේ ප්‍රතිපත්ති වලට ද
- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම සහභාගිත්වය සිරිතක් ලෙස සලකන සමිතිවල, යොවුන් වැඩ සටහන්, වැඩිහිටි සම්පත්, කලමනාකරණය, සහ ව්‍යාපාරයේ වෙනත් පැතිකඩ පිළිබඳව සියළුම මට්ටම්වලදී, ස්ත්‍රී පුරුෂයින්ට සමතැන දිම සත්‍ය බව ඔප්පුවන අවස්ථා

<u>බාලක බාලිකාවන්ට, ස්ත්‍රී පුරුෂයින්ට, සමාන අවස්ථා ලබා දීම පිළිබඳ වැදගත් (Resolutions) 3 ක් ප්‍රතිපත්තිවල අඩංගු වේ.</u>

යෝජනාව (Resoluion) 5/96

<u>සම්මේලනය</u>

- 1993 දී බැංකොක් නුවර පැවැත්වූ 33 වන ලෝක බාලදක්ෂ සම්මේලනයේ දී ............... 6 සහ 8 නැවත ස්ථිර කිරීම
- වොසම් (WOSM) සංවිධානයේ සාමාජික සංවිධාන වල සමාජිකත්වයට කාන්තාවන් ඇතුළත් කිරීම ඇගයීම
- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ප්‍රවර්ධනය සඳහා ඉලක්ක කරන ලද වැඩ සටහන් වල අවශ්‍යතාව සලකා බැලීම ගැහැණු හා පිරිමි ළමුන් සඳහා වැඩ සටහන් ඉදිරිපත් කරන ජාතික බාලදක්ෂ සංගම් වල ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම එක්ව
- නායක පුහුණුව යටතේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ විවිධ අවශ්‍යතා හා අත්දැකිම් සළකා බැලීම
- වොසම් (WOSM) සංවිධානයට අයත් ආයතන වල තීරණ ගැනීමේ කටයුතු වලදී කාන්තා නියෝජනය අල්ප බව
- සෑම කටයුත්තකදී මෙන් ම විශේෂයෙන් යොවුන් වැඩසටහන් සහ නායක පුහුණුවේ දී, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ විවිධ අවශ්‍යතා , කාන්තා සාමාජිකත්වයක් සහිත ජාතික බාලදක්ෂ සංගම්වලට නිර්දේශ කිරීමේ බලය ලෝක බාලදක්ෂ කමිටුව නිර්දේශ කරයි.

ජාතික සංගම් සහ ජගත් ආයතන තුළ, සෑම මට්ටමකදීම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ වඩාත් සාධාරණ නියෝජනයක් සඳහා කටයුතු කිරීම බලපත් ලෙස නිර්දේශ කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනාව (Resolution) 6/93

සම්මේලනය

බාලක බාලිකාවන් සහ ස්ත්‍රී පුරුෂයින් සඳහා සමාන අවස්ථා ලබා දීමේ වැදගත්කම.

- බාලක බාලිකාවන්, යොවුන් ස්ත්‍රී පුරුෂයින් සඳහා වැඩ සටහන් සැලසුම් කිරීමේ දී මිශ්‍ර අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබිඹුවන අයරින් ඒවා සකස් කරන ජාතික බාලදක්ෂ සංගම් දිරිමත් කරයි.
- මිශ්‍ර අධ්‍යාපනයෙන් සංගමය බලාපොරොත්තු වන ප්‍රයෝජනය ක්‍රියාවලිය සහ වැඩ සටහන, වැඩිහිටි නායක පුහුණු කිරීමේ අවස්ථා තුළින් ස්ථිර වශයෙන් පිළිබිඹු කරන ජාතික බාලදක්ෂ සංගම් දිරිමත් කරයි.
- එවැනි ජාතික සංගම් වලට , ලෝක වැඩසටහන් කමිටුව හරහා සහාය ලබා දීමට ලෝක කමිටුවෙන් ඉල්ලා සිටීම.

යෝජනාව (Resolution) 8/93

සම්මේලනය

- මෙම සම්මේලනය මගින් ලෝක වැඩිහිටි සම්පත් ප්‍රතිපත්තිය සම්මතකිරීම ගැන සලකා බැලීමට
- වොසම් (WOSM) සංවිධානය, ස්ත්‍රී පුරුෂ , බාලක බාලිකාවන් සඳහා විවෘත වූ සංවිධානයක් ලෙස සැලකිම
- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සමාන අවස්ථා ලබා දීමේ වැදගත්කම සලකා බැලීම
- වැඩිහිටි සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සමසේ සැලකීම වැදගත් අංශයක් බවට, කාන්තා සාමාජිකත්වය සහිත ජාතික බාලදක්ෂ සංවිධාන වලට සහ ලෝක බාලදක්ෂ කමිටුවට ආයාචනය කිරීම්

උපාය මාර්ගමය ප්‍රමුඛස්ථානය- බාලදක්ෂ ව්‍යාපාරය තුළ බාලක, බාලිකා, ස්ත්‍රී පුරුෂයින්

2002 වසරේ ජූලි මාසයේ දී තෙසලෝනිකි නම් ස්ථානයේ පැවැත්වූ ලෝක බාලදක්ෂ සම්මේලනයේ දී බාලදක්ෂ ව්‍යාපාරයේ උපාය මාර්ගයක් ඒකමතිකව සම්මත විය.

ගත වූ වසර 96 තුළ බාලදක්ෂ ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ බලපෑම ලොව පුරා සාර්ථක විය. වර්තමානයේ ද බාලදක්ෂ ව්‍යාපාරය ලෝකය පුරාම බලපෑමක් ඇති කරයි. 2007 වසරේ දී, බාලදක්ෂ ව්‍යාපාරය සියවස සමරන අවස්ථාවේ, 21 වන සියවසේ වේගයෙන් වෙනස්වන අවශ්‍යතා අනුව බාලදක්ෂ ව්‍යාපාරයේ ආභාෂය සහ යොවුන් ජනාවට හා නව යොවුන් වියේ අයට එය ආකර්ෂණීය අයුරින් පවත්වා ගැනීම සඳහා උපාය මාර්ගයක් සැලසුම් කිරීම වැදගත් යි

මෙය ඉටු කර ගැනීම සඳහා එහි අවශ්‍යතාවය නැවත ස්ථිර කිරීම(එහි මෙහෙවර හා එකගවීම) , ඒ මගින් කළ යුතු දෙය හඳුනා ගැනීම (දැක්ම එළිදැක්වීම) හා ඉන් අනතුරුව මෙම දැක්ම සාධනය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ග වෙත අවධානය යොමු වන සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. මේ පියවර තුනම උපාය මාර්ග තුළ අඩංගු විය යුතු ය.

බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවර සාධනය කර ගැනීමේ උපාය මාර්ග තුළ, උපායාංග 7 ක් හඳුනා ගෙන ඇත. බාලක,බාලිකාවන්ට සහ ස්ත්‍රී පුරුෂයන්ට මේවා අතුරෙන් තුන්වන ප්‍රමුඛත්වය ලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

03 වන උපාය මාර්ග ප්‍රමුඛත්වය- බාලක බාලිකාවන්, ස්ත්‍රී පුරුෂයින්

**ගෞරව දැක්වීමේ වෙනස්කම්, සමානත්වය දිරි ගැන්වීම සහ වගකීම බෙදා ගැනීම.**

උපාය මාර්ග පිළිබඳ ප්‍රමුඛත්වයේ අරමුණ වන්නේ, බාලදක්ෂ ව්‍යාපරයේ සෑම මට්ටමකදීම, බාලක බාලිකා, ස්ත්‍රී පුරුෂ සැමට සමාන අවස්ථා සැපයෙන ජාතික බාලදක්ෂ සංවිධාන වලට උදව් කිරීම සඳහා අවශ්‍ය වන සහාය සහ ආවුධ (Tools) හඳුනා ගැනීම යි. මේ මගින් සෑම දෙනාට ම අළුත් අවස්ථා සැලසේ. එසේ ම සමාජිකත්ව වර්ධනය සහ වැඩිහිටි නායකත්වය හරහා සංගම් වලට අයත් ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාවන් තුළ වඩා සමීප තුලනයක් ජනිත විය හැක.

යොවුන් ජනතාවගේ ප්‍රවර්ධනය සඳහා බාලදක්ෂ ව්‍යාපාරය දායක වේ.

ස්වයං – පරිපූර්ණ (self –fulfilled) පුද්ගලයින් ලෙස වඩාත් යහපත් ලෝකයක් ගොඩනැංවීමේ ඔවුන්ගෙන් සමාජයට අර්ථකාරී (Construetive) කාර්ය භාරයක් ද ඉටු වේ. සමාජය නිර්මාණය වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ එකතුවෙන් බැවින්, බාලදක්ෂ ව්‍යාපාරයේ දැක්ම මෙසේ යි.

- පෞද්ගලික වෙනස්කම් වලට ගරු කරමින්, සමාජයේ පවතින සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ කාර්යභාරයින්ට සීමා නොවී, ගැහැණු පිරිමි දෙපක්ෂයේ ම ළමුන්ට සහජ හැකියාවන් (Potention) මුළුමනින්ම වර්ධනය කර ගැනීමට අවස්ථා ලබා දීම.
- සංගම් වල සෑම මට්ටමකදීම නායකත්වය බෙදා ගනිමින්, බාලදක්ෂ ව්‍යාපාරයේ නියැලී ස්ත්‍රී පුරුෂයින්ට සමසේ සහයෝගය ලබා දීමේ අවස්ථා සැලසීම.

වොසම් (WOSM) සංවිධානයේ සියළුම කටයුතු වලදී සහ බාලදක්ෂ ව්‍යාපාරයේ සියළුම පැතිකඩවලදීත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම සම අවධාරණය දෙමින් මිශ්‍ර අධ්‍යාපනය අන්තර්ග්‍රහණය කිරීම.


බාලක, බාලිකාවන් හා යොවුන් ස්ත්‍රී පුරුෂයින් වෙත සම සේ අවධාරණය (Emphasis) යොමු කරමින් බාලදක්ෂ ව්‍යාපාරයේ සෑම අංශයකම වොසම් (WOSM) සංවිධානය මිශ්‍ර අධ්‍යාපනය අන්තර් ග්‍රහණය කර තිබේ. යොවුන් වැඩසටහන් හෝ වැඩිහිටි සම්පත් පිළිබඳව හෝ වේවා, එම සංවිධානයේ සියළුම ප්‍රයත්න වලින් මේ බව පිළිබිඹු වේ. අධ්‍යයන හා පර්යේෂණ, ප්‍රතිපත්ති සහ යෝජනාවලිය (Resolution) සාහිත්‍යය සහ ප්‍රකාශන, වැඩමුළු සහ සම්මේලන, කලාපීය සහ ලෝක මට්ටමේ බාලදක්ෂ ක්‍රියාකාරකම් වලදී මෙය පැහැදිලි වේ.

නොබෝ දා ප්‍රකාශයට පත් කළ පෝතක බාලදක්ෂ නායකයින් (1998) සඳහා සහ (2002) බාලදක්ෂ නායකයින්ගේ ජාත්‍යන්තර අත්පොත් මගින් ඉදිරිපත් කරන අධ්‍යාපනික යෝජනා සහ, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ගැන සළකා බලන විට, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අවශ්‍යතා සහ අපේක්ෂාවන් පිළිබඳව සමාන අවධාරණයක් ලබා දී තිබිම ඊට නිදසුනකි. "වයස අවුරුදු 7-11 අතර ගැහැණු හා පිරිමි ළමුන් සඳහා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයක්" (A Method of Non-Formal Education for Boys and girls from 7-11) සහ "වයස අවුරුදු 11-15 අතර යොවුන් ජනතාව සඳහා නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයක්" (A Method of Non-Formal Education for Young People from 11-15) වශයෙන් පිළිවෙලින් එම පොත්වල පිට කවරයේ සඳහන් වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**With Best Compliments from**

**Mr. N.D. Rajapaksha**
**Proprietor**




Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## Notes

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

PREMADASA RIDING SCHOOL

# Equestrian Scouts

## අශ්වාරෝහක බාලදක්ෂයෝ



මනුස්සකමේ ව්‍යාපාරය තවත් ඉදිරියට ගිහින්. මානුෂීය වශයෙන් බාලදක්ෂ ව්‍යාපාරයට කීර්තිමත් ඉතිහාසයක් හිමිව තිබෙනවා. ජනාධිපති සම්මාන ලාභී රණවිරුවන් ලෝකයටම ආදර්ශයක් වුණා. හිටපු ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් මට විශාල සතුටක් තිබෙනවා අශ්වාරෝහක ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාවක් වශයෙන් ව්‍යාප්ත කිරීමේදී බාලදක්ෂයින් එහි පෙර ගමන් කරුවන් වන බවට. ඒ සඳහා බාලදක්ෂයින් පුහුණුකරන සුරංජිත් ප්‍රේමදාස මහතාට මාගේ ගෞරවය හිමිවනවා.

**සී. බී. රත්නායක**
**හිටපු ක්‍රීඩා අමාත්‍ය**



සියලු දේ මුදල් මත තීරණය වන මෙම සමාජයේ සියලු දේම මුදල් නොවන බව ලෝකයාට කියන්න මට උවමනා වුණා. ඒ අනුව මම තීරණය කළා බාලදක්ෂයින් හට මම ඉගෙන ගත් අශ්වයින් පැදීමේ ක්‍රීඩාව උගන්වන්නට. සත්වයින්ට කරුණාව දක්වන ජයග්‍රාහකයෙන් ඉදිරියට යන්න කැමති බාලදක්ෂයින් මගේ අරමුණ ඉටු කරාවි.

**සුරංජිත් ප්‍රේමදාස**
**ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමයේ ලේකම්**



බාලදක්ෂ ප්‍රවීනතා විෂය නිර්දේශයේ ඇති අශ්වාරෝහක ප්‍රවීනතා පදක්කම් සමත් කිරීමට බාලදක්ෂයින් හට දැන් අවස්ථාව තිබෙනවා. බාලදක්ෂ ප්‍රධානයේ සිටින බාලදක්ෂයින් හට අශ්වාරෝහක ප්‍රවීනතා පදක්කම, ක්‍රීඩා කාණ්ඩයේ අනිවාර්ය පදක්කමක්. ඒ සඳහා බාලදක්ෂයින් හට දැන් උනන්දු විය හැකියි. ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමයේ ලේකම් සුරංජිත් ප්‍රේමදාස මහතා ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයට දක්වන මෙම දායකත්වය අගය කොට සලකමි.

**සී. බටුවන්ගල**
**බාලදක්ෂ ප්‍රධාන කොමසාරිස්**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පිය සටහන්
# Mile Stones

1912 - ලංකාවේ පළමුවන බාලදක්ෂ සමූහය, මාතලේ ක්‍රිස්තු දේව විදුහලේදී එෆ්. ජී ස්ටීවන්ස් මහතා විසින් ආරම්භ කිරීම
The first Scout Group in Sri Lanka (Ceylon) Started at Christ Church College Matale by Mr F.G Stevens.

1914 - එෆ්. ජී ස්ටීවන්ස් මහතා කොළඹට මාරු කිරීම සහ එම මාරුවීමෙන් අනතුරුව ස්ටීවන්ස් මහතා විසින් කොළඹ ගාළුමුවදොර ක්‍රිස්තු දේව පල්ලියේ බාලදක්ෂ සමූහයක් ඇරඹීම. ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත් වලට බාලදක්ෂ ව්‍යාපාරය පැතිරයාම ආරම්භ විය
Mr. Stevens transferred to Colombo & First Scout Group in Colombo started at Christ Church Galle Face by him & Scouting spreads to other parts of Sri Lanka.

